4 වන පිටෙන්

සහ මුළුමනින්ම ස්වාධීන ආයතන බවට පත්කිරීම.

12 අධ්‍යාපනය සඳහා කරනු ලබන රාජ්‍ය වියදම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 06%ක් ලෙස වෙන් කිරීම හා මෙම ප්‍රතිපාදන නිදහස් අධ්‍යාපනයත් එහි ගුණාත්මකභාවයත් අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් වර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් යෙදවීම.

13
- රාජ්‍ය සේවක සියලුම දීමනා මූලික වැටුපට එකතු කිරීම.
- පුද්ගලික අංශයේ සියලුම සේවකයින්ගේ වැටුප රු.2500කින් වැඩි කිරීමට අවශ්‍ය නීති සකස් කිරීම
- වතු කම්කරුවන්ගේ යෝජිත දෛනික වැටුප රු. 1000 දක්වා වැඩිකිරීම.
- අවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ විශාල පංගුවක් වන ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ශ්‍රමික ශිල්පීන් සඳහා ඉදිකිරීම් කර්මාන්ත පනතේද පිළිගෙන ඇති පරිදි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සහ රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

14 රජයේ හා ව්‍යවස්ථාපිත ආයතනවල රැකියාවලට බඳවාගැනීමේදී දේශපාලන පත්වීම් ලබාදීමේ ක්‍රමය අහෝසි කර සුදුසුකම් මත රැකියා ලබාදීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම.

15 ළමුන්ගේ හා කාන්තාවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා දැනට ඇති නීතිමය විධිවිධාන හා ආයතන ශක්තිමත් කිරීමත්, ළමා හා කාන්තා අපචාර පිළිබඳව විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීම.

16 වත්මන් ළමා හා තරුණ පරපුර මත්ද්‍රව්‍ය උවදුරෙන් ගලවා ගැනීම සඳහා විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය නතර කිරීමත්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව නීතිය දැඩි ලෙස ක්‍රියාවට නැගීම සඳහා අව්‍යශ කඩිනම් පියවර ගැනීම.

17 වී, රබර් සහ තේ සඳහා වන රජය විසින් තීරණය කර ඇති සහතික මිල පුද්ගලික අංශයටද බලපාන පරිදි නීතිගත කිරීම. අනෙකුත් කෘෂි නිෂ්පාදන සඳහාද සහතික මිල ලබාදීමේදී එම මිල ගණන්ද නීතිගත කිරීම.

18 කලාකරුවන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කෙරෙන, කලා නිර්මාණකරණයට පූර්ණ නිදහසද, සියලු පුරවැසියන්ට කලා නිර්මාණ රසවිඳීමට පහසුකම් සැලසීමද ඇතුළු කලා හා මාධ්‍ය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඒ සඳහා අදාල ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් පිහිටුවීම.

19 ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියට හා දැනුම ලබාගැනීමේ අයිතියට බාධා නොවන පරිදි කලා නිර්මාණකරුවන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපොළ කාර්යාංශය කඩිනමින් බලගැන්වීම.

20 ස්වභාවික සම්පත් සහ පරිසරය ජාතික අවශ්‍යතාවන්ට අනුව සංරක්ෂණය සහ තිරසර කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා දැනට පවතින පරිසරයට අදාළ ප්‍රතිපත්ති, පනත් සහ රෙගුලාසි සංරක්ෂණ උපායමාර්ග මත සමාලෝචනය කර ශක්තිමත් කිරීම.

## ජනතාව අපෙන් අහන උත්තර නැති ප්‍රශ්න දෙකක්

ප්‍රවීණ සාහිත්‍යවේදී
**ජයතිලක කම්මැල්ලවීර**



වසර 10ක් තිස්සේ පැවැති දූෂිත, අපරාධකාරී, විනාශකාරී මහින්ද රාජපක්ෂ පාලනය පරාජයට පත්කරන්න අපි ලිපි ලිව්වා; කතා කළා; උද්ඝෝෂණය කළා. ඒ නිසාම අපිට අද හමුවෙන හිතවතුන් අපෙන් අහන ප්‍රශ්න දෙකක් තියෙනවා. එකක් තමයි දැන් මොකද වෙන්නේ කියන එක. අනේක ප්‍රශ්නය අපිට මොකද වෙන්නේ කියන එක. තවත් පිරිසක් අන්තවාදී ප්‍රශ්නයකුත් අහනවා. ඒක තමයි මහින්ද රාජපක්ෂ ගෙදර යවලා මෛත්‍රීපාල බලයට ගෙනත් හරිගියාද? දැන් සතුටුද? කියලා. ඒකටනම් පිළිතුරක් තිබෙනවා. ඒකට කියන්න පුළුවන් මහින්ද රාජපක්ෂ පරාජයට පත්කිරීම නම් අපි ලොකු සතුටක් කියලා. නමුත් මුලින් කී ප්‍රශ්න දෙකට උත්තර දෙන්න අමාරුයි. රටේ දේශපාලනයට සංවේදී පිරිස් නම් දැන් දන්නවා මොකද වෙන්නේ කියලා. ඒක තමයි අපිත් දන්නේ. නමුත් අපිට මොකද වෙන්නේ කියන ප්‍රශ්නයට උත්තරයක් තමයි අපිට ඕන වෙලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ පරාජය කරන්න ජනතාව විසින් ගත් තීන්දුව ඉතාමත් තීරණාත්මක එකක්. ඒකේ අතුරු ඵලය ලෙස තමයි මෛත්‍රීපාල සිරිසේන බලයට එන්නේ. එහෙම නැතිව මෛත්‍රීපාල ජනාධිපති පුටුවේ වාඩි කරන්න කවුරුත් කතා කළේ නැහැ. නමුත් වසර පහක් පමණ තිස්සේ මහින්ද රාජපක්ෂ දුර්දාන්ත පාලනය පරාජය කරන්න මේ රටේ විවිධ පිරිස් දිවා රෑ කල්පනා කළා.

ඒ අනුව මෛත්‍රීපාල සිරිසේන බලයට ඇවිත් කියපු ප්‍රකාශ ගණනාවක් තිබුණා. එකක් තමයි ඔහු කිව්වා රට විනාශ කළ මහා පරිමාණ වංචා දූෂණ සඳහා මැදිහත්වූවන්ට තරාතිරම නොබලා දඬුවම් දෙනවා කියන කාරණය. අනෙක් එක තමයි ඔහු කිව්වා රටේ තිබෙන මජර දේශපාලනය වෙනුවට යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කරනවා කියලා. අනෙක් වැදගත් කරුණ තමයි රටේ ජාතිකත්වයන් අතර ජාතික සමගිය, සංහිඳියාව ගොඩ නගනවා කියන කාරණය. ඒ වගේම අනවශ්‍ය රාජ්‍ය වියදම් කපනවා කිව්වා. එතුමා තමන්ගේ වියදම් කපා හැරලා ඒක කරලත් පෙන්නුවා. 19වෙනි සංශෝධනය හරහා විධායක ජනාධිපති ධුරයේ බලතල අඩුකරනවා කිව්වා. ස්වාධීන කොමිසන් සභා ඇති කරනවා කියලත් කිව්වා.

ජනවාරි 08වෙනිදා සිට මාස හතක පමණ සංක්‍රාන්ති කාලයක් තිබුණා. 19වෙනි සංශෝධනය ගෙනාවා. නමුත් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සමීපතමයින් විසින් ඒකේ මදය සූරලා දාලා තමයි 19 සම්මත කළේ. ඒ ප්‍රමාණයෙන් හරි එය සම්මත වීම ගැන අපිට සතුටක් තිබෙනවා. නමුත් තොරතුරු දැනගැනීමේ පනත, විගණන පනත වගේ පනත් කිහිපයක්ම සම්මත කර ගන්න බැරිවුණා. එම සංක්‍රාන්ති කාලය තුළ මෛත්‍රීපාල මහත්තයා රටට වඩා වැදගත් යැයි සලකපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම කටයුතු කළේ රට ඉස්සරහට යන්න නොදී එක තැන තබාගන්න. නැත්නම් රට ආපස්සට ගන්න. ඔවුන්ගෙන් චෝදනාවට ලක්වී සිටි පුද්ගලයන් බේරගන්න.

මහ මැතිවරණයෙන් පසුව ජනතාව තීරණය කළේ රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුතු ආණ්ඩුවක් හදන්න ඕන කියලා. නමුත් මෛත්‍රීපාල ජනාධිපතිතුමා මැදිහත් වෙලා එතුමා විසින්ම චෝදනා එල්ල කළ ඇතැම් දූෂිතයන්ට ඇමතිකම්, නියෝජ්‍ය ඇමැතිකම්, රාජ්‍ය ඇමැතිකම් දීලා ජාතික ආණ්ඩුව කියලා හොඳටම ලුණු ඇඹුල් වැඩි අච්චාරු ආණ්ඩුවක් හැදුවා. දැන් ජනතාවට කියනවා ඒ අච්චාරුව කන්න කියලා.

දශක 6ක් 7ක් මේ රටේ වෙන දේවල් බලං හිටපු වැඩිහිටි පුරවැසියෙක් විදියට මටත් ප්‍රාර්ථනාවක් තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට මම කැමතියි. ජාතික ගැටලුවට දේශපාලන විසඳුමක් ලබාගැනීමට කැමතියි. 1970ට කලින් තිබුණු පාර්ලිමේන්තුව වගේ රටට වැදගත් වන සංවාදයක් ඇතිවෙන වැදගත් පුද්ගලයන් ඉන්න පාර්ලිමේන්තුවක් ඇතිවෙනවා දකින්න මම කැමතියි. ඒ වගේම රටේ ජනතාවගේ සංස්කෘතික ජීවිතය උසස් වෙනවා දකින්න මම කැමතියි. හිටපු ජනාධිපතිවරුන්ගේ පවුල්, ඇමැති මණ්ඩලයේ පවුල්, නඩත්තු කරන්න වැයකරන ජනතා මුදල්වලින් 75%ක්වත් කප්පාදු කරනවාට මම කැමතියි. ඒවා මගේ සිහින වෙන්න පුළුවන්. මම කැමතියි ඒ සිහිනය දකින්න.

ඒ වගේම මට තියෙන ඒ රෝගය අනෙක් අයට බෝ කරන්නත් මම කැමතියි. මේ හැම දේම කරගන්න බැරි වුණත් මෛත්‍රීපාල ජනාධිපතිවරයා පොරොන්දු වුණු දේවල් ඉටුකරන්න පුළුවන්. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට කලින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම වගේ දේවල් යහපත් දේශපාලන සදාචාරයක් ඇති කිරීම ඔහු පොරොන්දු වුණා. නමුත් යහපාලනයේ ඉස්පිල්ලක්වත් පිළිගන්නේ නැතිව මජර දේශපාලනයේ පියවරුන් වූ දූෂිත දේශපාලකයන්ට ඇමැතිකම් ලබාදීමට එතුමා කටයුතු කළා. රනිල් වික්‍රමසිංහත් පොරොන්දු වුණු දේවල් තිබෙනවා. ඒවා ඉෂ්ඨ කරගන්න මොකද කරන්නේ?

අපිට මොකද වෙන්නේ කියලා අහන අයට මම කියනවා, ඒ වෙනුවට අපිට දැන් මොකද කරන්න පුළුවන් කියලා අහන්න කියලා. ඒ නිසා තමයි අපි කාටත් පොදුවේ එකඟ වෙන්න පුළුවන් විධියේ යෝජනා 20ක් පෙළගස්වලා ඉදිරිපත් කරලා තිබෙන්නේ. අධ්‍යාපනයට 6%ක් දෙන එක පොරොන්දුවූ දෙයක්. තොරතුරු දැනැගනීමේ පනත, විගණන පනත ලබාදෙන්න ඔවුන් පොරොන්දු වුණා. නමුත් මේ පාලක කණ්ඩායම මේවා ඉෂ්ඨ කරයි කියලා විශ්වාස කරන්න අමාරුයි. ඒ නිසා එම ඉල්ලීම් නැවත නැවත මතක් කිරීමට ජනබලයක් ගොඩනගන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුව දැන් නඩු දාන්න බැහැ කියලා මහා පරිමාණ හොරුන් නිදහස් කරන තත්වයකට පත්වෙලා. නමුත් අපි දිගින් දිගටම බලපෑම් කරනවා දූෂිතයින්ට දඬුවම් දෙන්න පියවර ගන්න කියලා. ඒ වෙනුවෙන් තමයි අපි මේ උද්ඝෝෂණ ව්‍යාපාරය ගොඩනගලා තිබෙන්නේ.

## මහජන විපක්ෂයක් ගොඩනැඟිය යුතුයි

කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය
**නිර්මාල් රංජිත් දේවසිරි මහතා**



මේ යෝජනා මාලාව අලුත්ම දෙයක් නෙවෙයි. ජනවාරි 08වෙනිදා සිදුවූ දේශපාලන පරිවර්තනයට පසුබිම් වූ ජනතාවගේ අභිලාෂයක් තමයි මෙම යෝජනා මාලාව නියෝජනය කරන්නේ. ජනවාරි 08වෙනිදා සිදුවුණේ සාමාන්‍ය ආණ්ඩු පෙරළියක් නෙවෙයි. අතීතයේදී මෙවැනි ආණ්ඩු පෙරළි සිදුවෙලා තිබෙනවා. 1956 බැරෑරුම් දේශපාලන පරිවර්තනයක් සිදුවුණා. ඒ වගේම 1977දීත් 2004දීත් එවැනි ආණ්ඩු පෙරලීම් සිදුවෙලා තිබෙනවා. එවැනිම දේශපාලන පරිවර්තනයක් තමයි 2015දී සිදුවුණේ. එවකට පැවති ආණ්ඩු ප්‍රතික්ෂේප කරනවාට වඩා බලයේ සිටි සමස්ථයම ජනතාව විසින් ප්‍රතික්ෂේප කිරීමක් එහිදී සිදුවුණා. මේ වෙනස්කම් මගින් ජනතාව මූලික විපර්යාස ඉල්ලා සිටිනවා. එවැනි තත්වයක් තමයි විප්ලවයක් කියලා කියන්නේ. එවැනි විප්ලවයකින් මහජන අභිලාෂයන් ප්‍රකාශයට පත්වෙනවා. ජනතාව ඉල්ලා සිටීමෙන් පමණක් එවා ඉටුවෙයි කියලා සහතික වෙන්න පුළුවන්කමක් නැහැ. එම ජනතා අභිලාෂයන් ඉටු නොවීමටත් බලපාන සාධක තිබෙනවා. ජනවාරි 08වැනිදායින් පසුව, අගෝස්තු 17වැනිදායින් පසුව අපි හිතපු දේවල් සිදුවුණාද? නමුත් අපි ඒ ගැන පුදුම විය යුතු නැහැ.
1789 සිදුවූ ප්‍රංශ විප්ලවයත්, 1917 සිදුවූ රුසියන් විප්ලවයත් ඉතාම වැඩි තීව්‍රතාවයකින් සිදුවූ විප්ලවයන් දෙකක්. නමුත් එම වැඩි තීව්‍රතාවයකින් සිදුවූ විප්ලවයකින් පසුවත් ජනතාවගේ අපේක්ෂාවන් ඒ විදියටම සිදුවුණේ නැහැ. නමුත් ලංකාවේ සිදුවුණේ ඉතාමත් අඩු තීව්‍රතාවයකින් යුතු විප්ලවයක්. එනිසා අපේ අභිලාෂයන් ඒ විදියටම ක්‍රියාත්මක වෙයි කියලා හිතන්න බැහැ. මෙම දේශපාලන වෙනසේ ඉදිරියෙන්ම හිටපු ඇතැම් අය පවා තමන් ඉදිරිපත් කළ විවේචනවලට ප්‍රතිවිරුද්ධව ඇතැම් දේවල් වලට එකඟ වෙමින් ඉන්නවා.

මෙම යෝජනා මාලාව ඉදිරිපත් කිරීමේ වක්‍ර වැදගත්කමක් තිබෙනවා. මෙම වෙනස සිදුකරගැනීම වෙනුවෙන් කටයුතු කිරීමේදී මගේ ප්‍රමුඛතාවයන් 3ක් තිබුණා. එකක් තමයි මහින්ද පැරදුනත් නැතත් මහින්දට විරුද්ධව මතයක් ගොඩනැගීමට මැදිහත් වීම. දෙවැනි කාරණය තමයි මහින්ද ඇතුලු ක්‍රමය පරාජයට පත් කිරීම. තුන්වැනි කරුණ තමයි යම් යම් දේවල් සඳහා ප්‍රතිසංස්කරණවාදී ඉඩකඩක් ලබාගැනීම. අධ්‍යාපනයට 6%ක් ලබාදෙනවා වගේ පොරොන්දු ගණනාවක් පිළිබඳව පසුගිය මැතිවරණවලදී සංවාදයකට ලක්වුණා. දැන් මේ සිදුවෙමින් තිබෙන දේවල් රනිල් වික්‍රමසිංහ හරි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා හරි නොදැන කරනවා වෙන්න බැහැ. මොකද, ඔවුන් කරන දේ ගැන අවබෝධයක් ඔවුන්ට තිබෙනවා. උදාහරණයක් හැටියට ඇමැති මණ්ඩලය වැඩි කිරීම, පරාජිතයන්ට නැවත ඇමැතිකම් ලබාදීම වැරදියි කියලා ඔවුන් දන්නවා. නමුත් ඔවුන් එය කරනවා.

ඔවුන් මේ ආකාරයෙන් කටයුතු කරන නිසා තමයි යෝජනා මාලාවක් ඔවුන්ට බාරදීමෙන් වක්‍ර පණිවුඩයක් ලබාදෙන්න පුළුවන් වෙන්නෙ. ඒකෙන් අපි සිදුකරන්න බලාපොරොත්තු වෙන්නේ ඔවුන් විසින් ලබාදුන්නු පොරොන්දු ඔවුන්ට නැවත මතක් කරදීමක්. එහෙම මතක් කරන එක වැදගත්. පාලකයන්ට පමණක් නොවෙයි මෙම වෙනස සිදුකිරීමට මැදිහත් වුණු ජනතාවටත් මෙම ජනතා අභිලාෂයන් නැවත නැවත මතක් කර දීම වැදගත් කියලා මම හිතනවා. එනිසා අපි මහජන විපක්ෂයක් ගොඩනැගිය යුතුයි. ජනවාරි 08වැනිදා ප්‍රකාශයට පත්වුණු මහජනතාවගේ පොදු අභිලාෂයන් නියෝජනය කිරීම අත්‍යාවශ්‍ය දෙයක්.

## අපි නිහඬව බලා සිටිය යුතු නැහැ

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක**



ජනවාරි අටවෙනිදා මහින්ද රාජපක්ෂ පරාජයට පත්කරන්න මේ රටේ ජනතාව සමත් වුණා. රාජපක්ෂ මේ රට නීතියේ විධානය කඩාබිඳ දැමූ රාජ්‍යයක් බවට පත්කළා. ප්‍රජාතන්ත්‍රවාදය නිදහස නැතිකළා. ජනතාවගේ සිතුම් පැතුම් ආකල්ප යටපත් කොට රාජපක්ෂ පවුලේ සහ සමීපතමයින්ගේ සිතුම් පැතුම් ජනතාව තුළ ඇතිකරවන්න උත්සාහ දැරුවා. එනිසා රාජපක්ෂ පාලනය පරාජයට පත්කළ යුතුම කාර්ය බවට පත්වුණා. ඒ පිළිබඳව විවාදයක් තිබුණේ නැහැ.
ඔහු කල්පනා කළා 2022 දක්වා බලයේ රැඳී ඉන්න. මහින්ද රාජපක්ෂ 2022 වනතෙක් බලයේ සිටියා නම් ජනවාරි 08වෙනිදා සිදුකළ අරගලයක් වැනි

15 වන පිටට

Cartoon by PK

